# තනතුරු ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පවතින සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුරෙහි III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 02 ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරාගනු ලබයි.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

2.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.2 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

2.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

2.4 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.5 විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

03. වැටුප් පරිමාණය:

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

**රු. 82,150- 10x2400-8x2940- 17x3900 - රු.195,970/- (SL 1- 2025) වේ.**

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම්:

4.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

4.2 පළපුරුද්ද

නීතිඥවරයෙකු වශයෙන් මාස 06 ක සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

4.3 වයස් සීමාව

2025.11.07 දිනැති *ගැසට්* පත්‍රයේ පළවූ නිවේදනයට වැඩිමනත් වශයෙනි.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

4.4 කායික/ මානසික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.5 අනෙක් සුදුසුකම්

2025.11.07 දිනැති *ගැසට්* පත්‍රයේ පළවූ නිවේදනයට වැඩිමනත් වශයෙනි.

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4.1 සිට 4.5 දක්වා සියලුම සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලකුණු ලබාදෙන පටිපාටිය පහත වගුව පරිදි වේ:

| | *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගනු ලැබේ. |
| 2 | අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | අතිරේක පළපුරුද්ද | 20 | |
| 4 | පරිගණක සාක්ෂරතාව | 15 | |
| 5 | භාෂා ප්‍රවීණතාව | 15 | |
| 6 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතා | 20 | |
| **මුළු ලකුණු සංඛ්‍යාව** | | **100** | |

06. අයදුම් කිරීමේ ක්‍රමය :

අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විය යුතු අතර A4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් යොමු කිරීම :

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2026.06.09 දින හෝ ඊට පෙර** පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
තැ.පෙ. 573,
අලුත්කඩේ,
කොළඹ 12.

08. අයදුම්පත් කැඳවන **අවසාන දිනය 2026.06.09 දින වේ.** එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතු ය.

09. දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතන) නියුතු නිලධාරින්ගේ අයදුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

10. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.)

11. අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මැයි මස 13 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.